www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසප පොලිස්-රාජ්‍ය සැලසුම්වලට එරෙහිව ප්‍රසිද්ධ රැස්වීමක් පැවැත්වීමට යයි

## Sri Lankan SEP to hold a public meeting against police-state measures

2010 ජුලි 29

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි), ආන්ඩුවේ පොලිස්-රාජ්‍ය සැලසුම්වලට එරෙහිව අගෝස්තු 3 දා කොලඹ දී ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වනු ඇත.

සිය කප්පාදු වැඩපිලිවෙලට එරෙහිව නැගෙන මහජන විරුද්ධත්වයට හමුවේ, ජනාධිපති මහින්ද රාජපක්ෂ වැඩෙන මහජන අසහනය පාලනය කරනු වස් බියගැන්වීමේ හා මර්දන විධික්‍රම වඩවඩා යොදාගනිමින් සිටී. ආන්ඩුව "ජාතිය ගොඩනැගීමේ" සිය "ආර්ථික යුද්ධය" ගෙනයන තතු තුල, දශක දෙකක සිවිල් යුද්ධය තුල දී දෙමල මහජනතාවට එරෙහිව යොදාගැනුනු විධික්‍රම දැන් සමස්තයක් ලෙස වැඩකරන ජනතාවට එරෙහිව යොදාගනිමින් සිටී.

ඒ සම්බන්ධයෙන් මේ වන තෙක් පවතින වඩාත්ම කැපී පෙනෙන නිදසුන නම්, තරුන ත්‍රී-රෝද රථ රියදුරකු අත් අඩංගුවට ගෙන පහර දීමට එරෙහිව පැවති විරෝධතාවකට පසුව, ජුලි 4 දා මට්ටක්කුලිය ප්‍රදේශයේ පැල්පත් වාසීන් දහස් ගනනක් පොලීසිය විසින් කොටු කරනු ලැබීමයි. මෙම මෙහෙයුම සිදු වූයේ ආන්ඩුව කොලඹ නගරයේ පැල්පත් ඉවත් කිරීමේ පුලුල් වැඩපිලිවෙලක් ක්‍රියාවට දැමීමට සූදානම් වන තතු තුල ය.

ශ්‍රී ලංකාව තුල ආන්ඩුව ආඥාදායක විධික්‍රම වනාහි, ගෝලීය ආර්ථික අර්බුදය තව දුරටත් උග්‍ර වන තතු තුල ජාත්‍යන්තරව සිදු වන දේශපාලන ක්‍රියාදාමයන්ගේ තියුනු ප්‍රකාශනයක් පමනි. මෙම කාරනා ද ජාත්‍යන්තරවාදී හා සමාජවාදී විකල්පයක අවශ්‍යතාව ද සාකච්ඡා කරනු පිනිස අපගේ ප්‍රසිද්ධ රැස්වීමට සහභාගි වන ලෙස කම්කරුවන්ගෙන්, ගෘහනියන්ගෙන්, තරුනයන්ගෙන් හා බුද්ධිමතුන්ගෙන් අපි ඉල්ලා සිටිමු.

**ස්ථානය: කොලඹ මහජන පුස්තකාල ශ්‍රවනාගාරය**

**දිනය හා වේලාව: අගෝස්තු 3 දා සවස 4.00**

**ප්‍රධාන කතිකයා: සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස්**